බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ
ANCL දිනමිණ
මුල් පිටුව
2014 අගෝස්තු මස 05 වැනිදා අඟහරුවාදා

# ආගම නමින් මෝඩකම් කරන සිංහල බෞද්ධයෝ

483
Like
Share

පොතකින් පෙත්තක්

එක්තරා දුප්පත් මෝඩ බෞද්ධයෙක් ඊළඟ ආත්මයේ උසස්ව ඉපදීමේ බලාපොරොත්තුවෙන් බුද්ධ ප්‍රතිමාවට නොයෙක් පූජා කරන්ට යෙදුණා. එය දුටු පන්සලේ හාමුදුරුවෝ ඔහුට මෙසේ කියා තිබෙනවා.

“උපාසක උන්නැහේ, සියල්ලම පූජා කළත් මොකටද? උපාසක උන්නැහේගේ ඔළුවේ කෙස් නැහැ. ලබන ආත්මයේ තට්ටය ඇතිව උපන්නොත් අනිත් සේරම ලැබුණත් මොටද? ඒ නිසා හොඳට කෙස් ලැබෙන්න හිතාගෙන හොඳ කිතුල් රෑනක් බුදුහාමුදුරුවන්ට පූජා කරන්න.”

ඒ කීමට කන් දුන් මෝඩ උපාසකයා කිතුල් රෑනක් පූජා කළා. හාමුදුරුවෝ පන්සල වත්තේ වැට බැඳීමට ඒ කිතුල් රෑන පාවිච්චි කරලා තියෙනවා.

මම මේ කතාව උපුටා ගත්තේ පූජ්‍ය වල්පොළ රාහුල හාමුදුරුවන් ලියපු “සතොයද්‍ය” නමැති කුඩා ග්‍රන්ථයෙන්. බෞද්ධයන්ට නිදහස්ව හිතන්නට උගන්වන ලිපි පෙළක් ලෙස එය හඳුන්වා තිබෙනවා.

රාහුල හාමුදුරුවන් පිළිබඳ විශේෂ උත්සවයක් මේ නොබෝදා කොළඹ දී පැවැත්වුණා. අපේ රටේ බෞද්ධ යතිවරුන් අතරින් ශ්‍රේෂ්ඨ ගණයෙහිලා සැලකිය හැකි යතිවරයාණන් වහන්සේ කෙනකු ලෙස රාහුල හිමියන් හඳුන්වන්න පුළුවන්. උන්වහන්සේගේ ප්‍රඥාවන්තභාවයට කිට්ටු වෙන්න ලේසියෙන්ම වෙනත් බෞද්ධ භික්ෂුවකට බැහැ. ඒ ප්‍රඥා මහිමයෙන් උන්වහන්සේ මිථ්‍යා දෘෂ්ටික මතවාදවල එල්බගෙන සිටින බොහෝ මෝඩ සිංහල බෞද්ධයන්ට සැබෑ බුදුදහම කුමක්ද යන්න මනාව පහදා දී තිබෙනවා. “ලක්දිව බුදු සමයේ ඉතිහාසය”, “බුදුන් වදාළ ධර්මය” මෙන්ම මේ “සතොයද්‍ය” පොතත් ඒ අරමුණින් ලියූ කෘතියක්.

“සතොයද්‍ය” යනුවෙන් නම් කෙරෙන මෙම ග්‍රන්ථය රාහුල හිමියන් 1933 – 34 කාල වකවානුවේදී පමණ එනමින් ලියූ පත්‍රිකා හතක එකතුවක්. මෙහිදී බොහෝ විට ප්‍රශ්න - පිළිතුරු ආකෘතිය යොදාගෙන තිබෙන බව පෙනෙනවා. එය යමක් සරලව හා නිරවුල්ව වටහා දීමේ අගනා ක්‍රමවේදයක් බව අමුතුවෙන් කිව යුතු නැහැ. “සිංහල බෞද්ධයෝ දුරදිග නොබලා ආගමේ නමින් මෝඩකම් කරන බව” රාහුල හිමියන් මේ පොතේ එක් තැනක කියා තිබෙනවා. (මගේ මේ තීරුවට අදාළ ශීර්ෂය මා යොදා ගත්තෙත් ඒ ප්‍රකාශයෙන්) ඒ මෝඩකම් මොනවද යන්න මේ පොත කියවීමෙන් අපට වටහාගන්න පුළුවන්.

පළමු පරිච්ඡේදය නම් කර ඇත්තේ “නියම බුද්ධ පූජාව” යනුවෙන්. ප්‍රතිමාවක් ඉදිරියේ ආහාරපාන වර්ග තැබීමත් තවත් අනේකප්‍රකාර විකාර කිරීමත් බුද්ධ පූජා ලෙස සලකන බවත් නමුත් මේවා බුදුහාමුදුරුවන්ට සුදුසු පූජා නොවන බවත් මෙහිලා දැක්වෙනවා.




මෙය වඩාත් විස්තර කිරීම සඳහා උන්වහන්සේ එක්තරා සිද්ධියක් ද ඉවහල් කර ගන්නවා. ඒ මෙසේයි.

එක්තරා පාසලක් අතර පිහිටි විහාරස්ථානයක විශාල ලෙස ආහාර පූජාව පවත්වනු ලබනවා. විසි තිස් දෙනකුට යැපෙන පමණ ආහාර ඉවත් කරනු ලබනවා. පාසලට එන ඇතැම් දුප්පත් ළමයි දවල් දහය පමණ වන විට සිහි නැතුව වැටෙනවා. නමුත් ඔවුන්ට එක ආහාර වේලකින් සංග්‍රහ කරන කෙනෙක් නැහැ. බුදු හාමුදුරුවන්ගේ නමින් ප්‍රයෝජනවත් දෙය අඥාන ලෙස අහක දමනවා. අර දුප්පත් දරුවන්ට සංග්‍රහ කිරීම බුදුරජාණන් වහන්සේගේ වචනය පිළිපැදීම බව ඔවුන් දන්නේ නැහැ.


පහන් දැල්වීමත් බුද්ධ පූජාවක්. ඒ ගැනත් රාහුල හිමියන්ගේ බරපතළ විවේචනයක් තිබෙනවා. පහත වන්නේ උන්වහන්සේගේ ප්‍රකාශයක්.

“පන්සල් වත්තක් පුරා පහන් අසූහාරදහසක් දැල්වීම කවර නම් බුද්ධ පූජාවක්දැයි මට නොවැටහේ. බුදුරජාණන් වහන්සේ ජීවත්ව සිටින දවසකවත් මෙය උන්වහන්සේට ගෞරවයක් නොවේ. උන්වහන්සේටත් එළිය වුවමනා කරන්නේ එක මනුෂ්‍යයකුට වුවමනා පමණටය. බුදුරජාණන් වහන්සේ ජීවමානව ඇත්නම් උන්වහන්සේ මැද හිඳුවා, වටේ පහන් අසූහාරදහසක් දැල්වීම මොන තරම් පීඩාවක්දැයි සිතා බලන්න. සිද්ධස්ථානයකට සුදුසු පරිදි පහන් දැල්වීම අවශ්‍යයි. සිංහල බෞද්ධයෝ දුරදිග නොබලා ආගමේ නමින් මෝඩකම් කරති.” (පිටුව 14)

ධර්ම දේශනාවකින් පසු භික්ෂුවකට යමක් පූජා කිරීම හරියට කුලියක් දීම (නීතිඥයන්ගේ දක්ෂකම් හා කීර්තියේ හැටියට ගාස්තු ගෙවන්නාක් මෙන්) වැනි යැයි රාහුල හිමියන් කියා තිබෙනවා. දැන් බණ කීම එක්තරා රක්ෂාවක් වී ඇති බවත් ඇතැම් ධර්ම කථිකයන් ධර්ම දේශනා කොට ලැබූ පිරිකර විකුණා පොහොසත් වී ඉඩම් මිලයට ගෙන තිබෙන බැව් ද ප්‍රකට රහස් බව උන්වහන්සේ තවදුරටත් කියා සිටිනවා.



දන්දීම ගැනත් රාහුල හාමුදුරුවන් ලියා කියා ඇති දේ නුවණින් යුතුව සිතා බැලීම බෞද්ධයන්ගේ යුතුකමක්. අද පවත්නා පරිදි සියක් නමට, දහස් නමට දන් දෙන ක්‍රමය ඇත්තෙන්ම නුවණැතියන් සිනස්සන අඥාන වැඩපිළිවෙළක් බවයි රාහුල හාමුදුරුවන්ගේ මතය. මෙසේ පන්සිය නමට, දහස් නමට ප්‍රසිද්ධ දන්දීමේදී මුහුණපාන්ට සිදුවන අපරාධයක් නම් සත්ව ඝාතනය බව උන්වහන්සේ කියනවා. මස් මාංශ වළඳන භික්ෂූන් සිය දහස් ගණනක් එක දිනක එක තැනකට දානයක් පිණිස රැස්වන බැව් දැනගත් විට මස්කඩකාරයෝ බලාපොරොත්තු සහිතව විශේෂයෙන් වැඩිපුර සතුන් මරන බව උන්වහන්සේ පෙන්වා දෙනවා.



මහණ කිරීම් ආදී ශාසනික වැඩවලදී නැකැත් බැලීම යෝග්‍ය ද යන ප්‍රශ්නය එක්තරා පරිච්ඡේදයකදී මතු කෙරෙනවා. ඊට රාහුල හිමියන් දෙන පිළිතුර මෙසේයි.

"සැබැවින්ම නැත. නැකැත් බැලීම ආනයනික තිරශ්චීන විද්‍යාවකි. එය බුද්ධ වචනයට කරන නින්දාවකි." (පිටුව 66)

මෙලෙස කුලභේදය ගැන, රහත් බව ලැබීම ගැන, පෝය දිනය බෞද්ධයාට විශේෂ වූවක් නොවන බව යනාදී වශයෙන් වූ විවිධ විවාදාපන්න කරුණු "සත්‍යෝදය" පොතට ඇතුළත් වෙනවා. රාහුල හිමියන් මේවා ලියා ඇත්තේ 1930 ගණන්වල. අද වන විට සිංහල බෞද්ධයන් ඊටත් වඩා මිථ්‍යා දෘෂ්ටිකයන් වී ඇති බව හාත්පස සමාජය නිරීක්ෂණය කිරීමෙන් පෙනී යනවා. එබඳු පසුබිමක මේ පොත කියවීම, කියවා කරුණු සිතට ගැනීම, එය සිතට ගෙන ඒවා නිසි පරිදි පිළිපැදීම අතිශය වැදගත්.

සුනිල් මිහිඳුකුල
pothakinpeththak@gmail.com

**0 Comments** Sort by Oldest

Add a comment...

Facebook Comments Plugin

## ලිහා බලන්න

ආගම නමින් මෝඩකම් . . .
කුඩු ප්‍රශ්නය කෙසේද යත්
හිමාලයේ වල් අලින් හා . . .
පන්සලට රාමසාන් ගෙනා . . .
පරණ වළං සහ අලුත් වළං
උගත් ජීවිත
ඊශ්‍රායලය, පලස්තීනය හා දේශපාලන
මිනිසත්බව
ප්‍රියාදර ප්‍රියා
කුස්සි කතා
සසර සැරිසරන තෙක් ඔහු අපේ











## ලිපි ලියන්නෝ

සුනිල් මිහිඳුකුල
බන්දුල පී දයාරත්න
සුනිල් සරත් පෙරේරා
කමල් පෙරේරා
ජයන්ත ඒකනායක
දසුනි හෙට්ටිආරච්චි
හිමාලි එන්. ලියනගේ
තුෂානි හේවගේ
ශාන්ති දිසානායක
මහානාම දුනුමාල
බුද්ධදාස ගලප්පත්ති

Designed by ANCL Web Dept. Copyright © 2015 The Associated Newspapers of Ceylon Limited - All right reserved.